# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ

**නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වය සහ උත්කෘෂ්ට තත්ත්වයන් ප්‍රදර්ශනය කොට ඇති උපදේශන නීතිඥවරයන් වශයෙන් වෘත්තියෙහි නිරත වන නීතිඥවරයන් විසින් සපයනු ලබන සේවාව පිළිගැනීමේ සහ අගය කිරීමේ අදහසින් යුක්තව, ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2023 අගෝස්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූලි මස 19 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[196 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ

එල්.ඩී.-ඕ. 13/2023

**නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වය සහ උත්කෘෂ්ට තත්ත්වයන් ප්‍රදර්ශනය කොට ඇති උපදේශන නීතිඥවරයන් වශයෙන් වෘත්තියෙහි නිරත වන නීතිඥවරයන් විසින් සපයනු ලබන සේවාව පිළිගැනීමේ සහ අගය කිරීමේ අදහසින් යුක්තව, ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක      දරන ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීම

**2.** (1) අග්‍ර විනිශ්චයකාරවරයාගේ සහ අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලබා ගැනීමෙන් පසු අතිගරු ජනාධිපතිතුමා විසින්-

(අ) ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කරනු ලබන දිනට වසර තිස් පහකට නොඅඩු කාලසීමාවක් උපදේශන නීතිඥවරයකු වශයෙන් සක්‍රීයව නීතිඥ වෘත්තියෙහි නිරතව සිටින;

(ආ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ටත්වයට පත්ව ඇති සහ පැවැත්මෙහි හා වෘත්තීය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි උත්කෘෂ්ට තත්ත්වයක් පවත්වාගෙන ඇති;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ යම් අපරාධමය වරදකට වරදකරු වී නොමැති;

(ඈ) 1988 ශ්‍රේෂ්ඨාධිකරණයේ (නීතිඥවරයන් සඳහා වූ වෘත්තීය පැවැත්ම සහ ආචාරධර්ම පිළිබඳ) රීති සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත යටතේ යම් වෘත්තීය විෂමාචාරයකට වරදකරු වී නොමැති; සහ

(ඉ) මනා චරිතයකින් සහ කීර්තියකින් යුත් තැනැත්තකුව සිටින,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් නීතිඥවරයකුට ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(2) යම් උපදේශන නීතිඥවරයකුට ජ්‍යෙෂ්ඨ උපදේශන නීතිඥ බහුමානය ප්‍රදානය කිරීමේ දී, අතිගරු ජනාධිපතිතුමා විසින් එම උපදේශන නීතිඥවරයාට ඒ පිළිබඳ සහතිකයක් ලබාදිය යුතු ය.

අර්ථ නිරූපණය

**3.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ -

"උපදේශන නීතිඥවරයා" යන්නෙන්, එම නීතිඥවරයාගේ උපදෙස් මත අධිකරණයේ පෙනී සිටීම සඳහා යම් අධිනීතිඥවරයකුට උපදෙස් ලබා දීම ප්‍රධාන කාර්යය වූ නීතිඥවරයකු අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.